# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පිළිකා සරණ භාරය (සංස්ථාගත කිරීමේ)

**පිළිකා සරණ භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එඩ්වඩ් ගුණසේකර මහතා විසින්
2017 මැයි මස 03 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2017 අප්‍රේල් මස 11 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[178 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# පිළිකා සරණ භාරය (සංස්ථාගත කිරීමේ)

## පිළිකා සරණ භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

*පූර්විකාව.*

"පිළිකා සරණ භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන භාරයක්, එකී භාරයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ භාරයේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා එලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී භාරය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී භාරය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මෙම පනත 2017 අංක  දරන පිළිකා සරණ භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*පිළිකා සරණ භාරය සංස්ථාගත කිරීම.*

2. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) 'පිළිකා සරණ භාරය' නමින් වූ භාරයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) "පිළිකා සරණ භාරය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය, තව ද, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

(2) 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා සංස්ථාව, ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ.*

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) පිළිකා රෝගය වළක්වාගැනීම - ශ්‍රී ලංකාවේ පිළිකා රෝගය වළක්වා ගැනීම සඳහා කළ හැකි ඕනෑම කර්යයක් ඉටු කිරීම;

(ආ) පිළිකා රෝගය කල් ඇතිව හඳුනාගැනීම - චිකිත්සා හා පරීක්ෂාවන් මගින් කල් ඇතිව හඳුනාගත හැකි (පියයුරු පිළිකා, මුඛ පිළිකා, ගැබ්ගෙල පිළිකා වැනි) විවිධ වර්ගයේ පිළිකා කල් ඇතිව හඳුනාගැනීම සඳහා ඵලදායි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඇ) පිළිකා රෝගය හඳුනාගැනීම සහ ප්‍රතිකාර කිරීම - විශේෂයෙන් සුවකළ හැකි පිළිකා රෝග හඳුනාගැනීම සහ එයට ප්‍රතිකාර කිරීම සඳහා ඵලදායි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඈ) සහන සත්කාරක සේවාව - සමාජය සහ රෝහල් වෙත යොමුව පිළිකා රෝගීන් සහ ඔවුන්ගේ පවුල්වල අය සඳහා ගිලානෝපස්ථාන සහ සහන සත්කාරක සේවා ක්‍රියාත්මක කිරීම;

(ඉ) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වෘත්තිකයන්ට ද, රෝගීන්ගේ පවුල්වල අයට සහ සහන සේවකයන්ට ද, පිළිකා රෝගය කල් ඇතිව හඳුනාගැනීමට, ප්‍රතිකාර සහ සහන සත්කාරක සේවා ලබා දෙන වෙනත් උපකාරක ආයතනවලට ද දැනුම හා පුහුණුව ලබාදීම සඳහා සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම;

(ඊ) පිළිකා රෝගීන්ගේ අධ්‍යාත්මික, මානසික, සමාජීය හා ආර්ථික තත්ත්වය නගාසිටුවීම සඳහා සහාය වීම;

(උ) ශ්‍රී ලංකාව තුළ හා විදේශයන්හි පිළිකා රෝගය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා එමගින් පිළිකා රෝගය වළක්වා ගැනීම, රෝගය කල් ඇතිව හඳුනාගැනීම, රෝග විනිශ්චය, ප්‍රතිකාර පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ සහන සත්කාරක සේවා පැවැත්වීම;

(ඌ) භාරයේ අරමුණු හා පරමාර්ථවලට අනුකූලව පිළිකා රෝගයෙන් පීඩා විඳින දුප්පත්, අසරණ, අනාථ, වැන්දඹු, තරුණ අයට හා විශේෂයෙන් දරුවන්ට උපකාර කිරීම; සහ

(එ) ඉහත දැක්වෙන අරමුණු ඉටුකිරීම සහ ප්‍රවර්ධනය සඳහා රජය හා/හෝ වෙනත් සංවිධාන සමග සහයෝගයෙන් හා සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක, අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමග සංස්ථාවේ කාර්ය, ගැටුම් සහගත නොවන බවට සංස්ථාව වගබලා ගත යුතු බව.

**4.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්යය අතර, කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත්කරගනු ලබන සභාපති ඇතුළු හත් දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මගින් පරිපාලනය සහ කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උප වගන්තියේ කුමක් සඳහන් වුව ද, භාරයේ භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා සංස්ථාවේ පළමු සභාපතිවරයා විය යුතු අතර, ස්වකීය ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් මිස ජීවිත කාලය තුළ එකී ධුරය දැරිය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුවම වූ දිනයේ දී භාරයේ භාරකාර මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ හෝ ඉන් එක පරමාර්ථයක් වැඩි දියුණු කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීම, ඉටුකිරීම හා ක්‍රියාත්මක කිරීම ඇතුළු පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට තිබිය යුතු ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම,

උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නීයාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට කෙලින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍යවලින් ත්‍යාග, පරිත්‍යාග හෝ රික්තවරණ භාරගැනීම;

(ඈ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම සහ යම් බැංකුවක ජංගම තැන්පතු සහ ඉතිරිකිරීමේ ගිණුම් පවත්වාගෙන යාම;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යයි සංස්ථාව විසින් සඳහන් කරනු ලබන ආකාරයට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇප මත ණයට ගැනීම හෝ ආයෝජනය කිරීම; සහ

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකරගැනීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

**7.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, ඔවුන් ඇතුළත් කරගැනීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ ඔවුන්ගේ බලතල හා ධුර කාලය;

(ආ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පවත්වන ස්ථාන, වේලාව, නිවේදන හා න්‍යාය පත්‍ර, එකී රැස්වීම්වල ගණපූරණය, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, අරමුදල් දැරීම සහ ගිණුම් පවත්වාගෙන යාම හා විගණනය කිරීම; සහ

(ඉ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි අරමුණු මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම්කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් එවැනිම රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තේ ය.

භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්ගේ නාමලේඛනය.

**8.** භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම්, ලිපින සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජිකයන්ගේ නාමලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) මෙතෙක් සහ මින්පසු සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලුම මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ නමින් එක බැංකුවක හෝ බැංකු කිහිපයක තැන්පත් කළ හැකි ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා ‘සුදුසුකම්ලත් විගණකවරයා’ යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව.

**11.** (1) භාරකාර මණ්ඩලය විසින් සෑම මුදල් වර්ෂයක් සඳහා ම සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග ඒ වාර්තාව අදාළ වන වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර සෞඛ්‍ය කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුමක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**12.** (1) සංස්ථාවේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු ලේඛනයකට හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම ලියා අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි මණ්ඩලයේ යම් ධුර දරන්නකුගේ භාරයේ තිබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

**13.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට භාරයට අයවිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු සම්මාදම් මුදල් හෝ දයක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**14.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, කිසියම් ගිවිසුමක් මත හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට නීතියෙහි ලා

සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එම දේපළ සංස්ථාවේ 7 වන වගන්තිය යටතේ බලපවත්නා රීතිවලට යටත්ව විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම.

**15.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාවේ මුදල් හා දේපළ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ මුදල්, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**16.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වැනි උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම, යම් මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සංස්ථාවේ සාමාජිකයන් විසින් බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**17.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**18.** මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.